2109

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## Uva Provincial Department of Education

## පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II | කාලය: පැය 02 යි. |
|---|---|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- I කොටසින් ප්‍රශ්න 2 ක් ද, II කොටසින් ප්‍රශ්න 2 ක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01). අ.පො.ස. ( උ.පෙළ) විභාගය අවසන් වූ විගසම ඇඳුම් මැසීමේ ඩිප්ලෝමාවක් හැදෑරීමට දිලානි සමත් විය. මෙම පාඨමාලාව සාර්ථකව නිමකළ ඇය නගරයට තරමක් ආසන්න කඩ කාමරයක් කුලියට ගෙන තවත් ඇඳුම් මසන්නියන් හතර දෙනකු බඳවා ගෙන "දිලූ ටේලර්" නමින් ව්‍යාපාරයක් 2023.01.01 ආරම්භ කළා ය. ආරම්භයේ දී ඇය ප්‍රාග්ධනය ලෙස මෙම ව්‍යාපාරයට රුපියල් 600 000 යෙදවූ අතර රුපියල් 400 000 ණය මුදලක් ද ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදී. ඉන් රුපියල් 400 000 වැය කොට මහන මැෂින් හතරක් ලබා ගන්නා ලදී. නවීන විලාසිතා වන්ට අනුව මසන ලද ඇඳුම් ඉතා ඉහළ ගුණාත්මයකින් පාරිභෝගිකයාට සාධාරණ මුදලකට ලබා දීම මගින් ලාභ ලැබීම ඇයගේ අරමුණ විය. ඒ සඳහා තම Facebook පිටුව හරහා මනා ප්‍රචාරණයක් ඇය සිදු කළා ය. මේ අනුව ලැබෙන ඇණවුම් විශාල වූ බැවින් තමා හැදෑරූ පාඨමාලාව සඳහා සම්බන්ධ වී ඩිප්ලෝමාධාරිණියක වූ තිළිණි ද සමග එක් වී ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනීමට ඇයට හැකි විය. තම යෙහෙළිය මෙම ව්‍යාපාරයට සම්බන්ධ වීමේ දී රුපියල් 500 000 ක් වටිනා මහන මැෂින් 5 ක් ව්‍යාපාරයට යෙදවූවා ය. ඒ අනුව තවත් සේවිකාවන් පස් දෙනෙකුද අලුතෙන් බඳවා ගන්නා ලදී. කාලපරිච්ඡේදය තුළ දරන ලද වියදම් පහත වේ.

| | |
|---|---|
| වැටුප් ගෙවීම් | 300 000 |
| විදුලි ගාස්තු. | 20 000 |
| ගොඩනැගිලි කුලී. | 50 000 |
| යන්ත්‍ර ක්ෂය | 90 000 |
| අත්පිට ගැනුම්. | 500 000 |
| අත්පිට විකුණුම් | 1500 000 |

i). (අ). ආරම්භයේ දී මෙම ව්‍යාපාර සංවිධාන කුමක් ද?
(ආ). පසුව මෙම ව්‍යාපාරයේ අයිතිය වෙනස් වීමත් සමඟ ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

ii). (අ). මෙම ව්‍යාපාරය විසින් ඉටු කරන මූලික මිනිස් අවශ්‍යතාව සහ ඊට අදාළ වුවමනා මොනවාද?
(ආ). "දිලූ ටේලර්" ව්‍යාපාර සංවිධාන වර්ගයේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

iii). (අ). මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතු ද?
(ආ). ඊට අදාළ හේතු ව පැහැදිලි කරන්න.

iv). (අ). මෙම ව්‍යාපාරය සතු ශක්තීන් දෙකක් ලියන්න.
(ආ). මෙම ව්‍යාපාරයට ඇති විය හැකි තර්ජන දෙකක් ලියන්න.

v) (අ). මෙම ව්‍යාපාරය ආරම්භක දිනට ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිත ව ලියන්න.
(ආ). මෙම ව්‍යාපාරය සතු ප්‍රධාන අරමුණු 2 ක් ලියන්න.

vi) (අ). මෙම සිද්ධියට අදාළ කළමනාකරණ කාර්යයක් වන සැලසුම්කරණය සඳහා උදාහරණයක් ලියන්න.
(ආ). අලෙවි මිශ්‍රයේ ප්‍රවර්ධනය සඳහා සිද්ධියෙන් උපුටා ගත් උදාහරණයක් ලියන්න.

vii) ගිණුම් කාලච්ඡේදයට අදාළ ව මුදල් ගිණුම පිළියෙළ කරන්න.

viii) මෙම ව්‍යාපාරයේ අදාළ කාලච්ඡේදයේ ශුද්ධ ලාභය කොපමණ ද?

ix) (අ). මෙම ව්‍යාපාරය විසින් පවත්වා ගන්නා මූලික පොත් දෙකක් ලියන්න.
(ආ). එම මූලික පොත් ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලේඛන මොනවා ද?

x) මෙම ව්‍යාපාරයේ අවසාන මුදල් ශේෂය කොපමණ ද?

(ලකුණු $2 \times 10 = 20$)



CamScanner

## I කොටස

(02). i) (අ) බැංකු විසින් සපයන සේවා දෙකක් නම් කරන්න.

(ආ) වාණිජ බැංකුවක් යනු කුමක් ද?

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ණය කාඩ් පතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් තිබිය යුතු ය. (.............)

(ආ) රේඛනය තුළින් වාණිජ බැංකුවක නමක් සඳහන් වීම සාමාන්‍ය රේඛනය නම් වේ. (.............)

(ඇ) දේශීය නිෂ්පාදිත විදේශ රටවලට විකිණීම අපනයනය නම් වේ. (.............)

(ඈ) ශ්‍රමදානයකට සහභාගී වන්නන්ට ලබා දීම සඳහා පාන් විස්සක් මිල දී ගැනීම තොග වෙළඳාමකි. (.............)

iii) (අ) නිෂ්පාදිතයේ ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග වන ආකාර දෙක දක්වන්න.

(ආ) හිමිකාරත්වය අනුව ව්‍යාපාර ප්‍රධාන වශයෙන් වර්ග කරන්නේ කෙසේ ද?

iv) (අ) ව්‍යාපාර කෙරෙහි ඇල් මැති පාර්ශ්ව දෙකක් නම් කරන්න.

(ආ) එම එක් එක් පාර්ශවය ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දැක්වීමට අදාළ හේතුව බැගින් ලියන්න.

(මුළු ලකුණු 08)

(03). i) (අ) රක්ෂණ මූලධර්ම දෙකක් නම් කරන්න.

(ආ) චෙක්පතක් යනු කුමක් ද?

ii) (අ) සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් ලියන්න.

(ආ) ප්‍රවාහන මූලිකාංග නම් කරන්න.

iii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) අංගෝපාංග යනු නිෂ්පාදිත මිශ්‍රයට අයත් විචල්‍යයකි. (.............)

(ආ) චෙක්පතක් සම්බන්ධයෙන් අව්‍යාජ හිමිකමක් ඇති බව දැක්වීමට එම චෙක්පත පිටසන් කරනු ලබයි. (.............)

(ඇ) ස්ථාවර තැන්පතු සහතිකය ඇපයට තබා ණය මුදලක් ලබාගත නොහැකිය. (.............)

(ඈ) සේවකයන්ගේ අයහපත් ආකල්ප ව්‍යාපාරයට තර්ජනයකි. (.............)

iv) (අ) කළමනාකරණ කාර්යයන් හතර නම් කරන්න.

(ආ) ඉලක්ක වෙළඳපළ යනු කුමක් දැයි සඳහන් කරන්න. (මුළු ලකුණු 08)

(04). i) (අ) සාමාන්‍ය කොටස් වල ආයෝජනය කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

(ආ) රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ දෙකක් ලියන්න.

ii) (අ) නිෂ්පාදන පිරිවැය මූලිකාංග නම් කරන්න.

(ආ) ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීමට වඩා ස්ථාවර තැන්පතුවක මුදල් තැන්පත් කිරීමෙන් ලබා ගත හැකි වාසි දෙකක් ලියන්න.

iii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සමාගමක හිමිකම සමාන පංගු වලට බෙදා ඉන් එක් පංගුවක් කොටසක් ලෙස හැඳින්වේ. (.............)

(ආ) සැලසුම් කළ කාර්යය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට මානව සම්පත් හැසිරවීමේ ක්‍රියාවලිය පාලනයයි. (.............)

(ඇ) ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය සමාගමක ලක්ෂණය කි. (.............)

(ඈ) භාණ්ඩාගාර බිල්පත් සමාගම් මගින් නිකුත් කරයි. (.............)

CamScanner

iv) (අ) බැංකු අයිරාවක් යන්න හඳුන්වන්න.

(ආ) චෙක් පතක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

(මුළු ලකුණු 08)

## II කොටස

(05). i) පහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයකින් නිරූපණය කරන්න.

(අ) රු.300 000 මුදලක් යොදවා ව්‍යාපාරය ආරම්භ කිරීම.

(ආ) රු.150 000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම.

(ඇ) රු.75 000 ක භාණ්ඩ රු.100 000 කට අත්පිට විකිණීම.

(ඈ) රු.5 000 ක විදුලි ගාස්තු මුදලින් ගෙවීම.

ii) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(අ) ණයගැතියෝ ....................................... ගිණුමක් වේ.

(ආ) කාල පරිච්ඡේදයකට අදාළ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ............................. පිළියෙල කරයි.

(ඇ) වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම සටහන් කරන මූලික සටහන් පොත වන්නේ, ............................................ යි.

(ඈ) වගකීම වැඩි වීම ....................................... අතර වත්කම් වැඩි වීම............................. වේ.

iii) පහත ගනුදෙනු ගැනුම් ජ'නලයක දක්වන්න.

(අ) ඉන්වොයිසි අංක 125 යටතේ පසන්ගෙන් ණයට ගැනුම් රු.150 000 ( අඩු කළ වෙළෙඳ වට්ටම10% )

(ආ) ඉන්වොයිසි අංක 205 යටතේ ඉඳුවරගෙන් ණයට ගැනුම් රු.50 000

(ඇ) ඉන්වොයිසි අංක 250 යටතේ අනුහස්ගෙන් ණයට ගැනුම් රු 200 000 (අඩු කළ වෙළෙඳ වට්ටම 12%)

(මුළු ලකුණු 12)

(06). i) සරත්ගේ ව්‍යාපාරයේ 2024. 01.31 දිනට බැංකු ප්‍රකාශය එදිනයට බැංකු ගිණුමේ ශේෂය සමඟින් එකඟ නොවිය. බැංකු ගිණුමේ ශේෂය රු.65 000 ක් විය. වෙනසට හේතු පහත පරිදි අනාවරණය කර ගන්නා ලදී.

1) නිකුත් කළ නමුත් පහත දැක්වෙන චෙක් පත් බැංකුවට ඉදිරිපත් වී නැත.

චෙක්පත් අංක "101020" රු.25000

චෙක්පත් අංක "101022" රු.20000

2) තැන්පත් කළ නමුත් උප ලබ්ධි නොවූ චෙක්පත් පහත දැක්වේ.

චෙක්පත් අංක "203101" රු. 32000

චෙක්පත් අංක "330301" රු.17500

3) බැංකුවට සෘජු වම ලද ණයගැති ප්‍රේෂණය රු.40 000

4) ස්ථාවර නියෝග මත ගෙවා ඇති බැංකු ණය වාරිකය රු.22500

ඔබ විසින්,

(අ) බැංකු ගිණුම සංශෝධනය කරන්න.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කරන්න.

CamScanner

ii) (අ) සුළු මුදල් අග්‍රිමය යනු කුමක් ද?

(ආ) කුමාරිගේ ව්‍යාපාරයේ සුළු මුදල් ගනුදෙනු පහත දැක්වේ. ඒ ඇසුරින් සුළු මුදල් පොත පිළියෙළ කරන්න.

| දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 2024.01.01 | අග්‍රිමය ලැබුණා. | 5000 |
| 2024.01.05 | A 4 කොළ | 750 |
| 2024.01.09 | තැපැල් ගාස්තු | 1200 |
| 2024.01.12 | කුලී රථ ගාස්තු | 360 |
| 2024.01.16 | තේ කොළ, සීනි, කේක් | 1750 |
| 2024.01.20 | බස් ගාස්තු | 350 |
| 2024.01.22 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා. | |

iii) නිෂ්පාදන පිරිවැය මූලිකාංග නම් කරන්න.

(මුළු ලකුණු 12)

(07). පහත දැක්වෙන්නේ පෙරේරා ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුමයි.

| ගිණුමේ නම | හර | බැර |
|---|---|---|
| ලී බඩු ( පිරිවැයට) | 200 000 | |
| වැටුප් හා වේතන | 20 000 | |
| මුදල් | 30 000 | |
| ගොඩනැගිලි ( පිරිවැයට) | 900 000 | |
| 2023 .01 .01 තොගය | 10 000 | |
| ගැණුම් | 300 000 | |
| විකුණුම් | | 700 000 |
| 10% බැංකු ණය | | 200 000 |
| ණය ගැතියෝ | 50 000 | |
| ණය හිමියෝ | | 30 000 |
| විදුලි ගාස්තු | 10 000 | |
| රක්‍ෂණ ගාස්තු | 15 000 | |
| ප්‍රචාරණ වියදම | 10 000 | |
| විවිධ ආදායම් | | 30 000 |
| දුන් වට්ටම් | 5 000 | |
| ලද වට්ටම් | | 8 000 |
| ගෙන ඒමේ කුලී | 8 000 | |
| බැංකු ණය පොලී | 10 000 | |
| ප්‍රාග්ධනය | | 600 000 |
| | 1568 000 | 1568 000 |

අමතර තොරතුරු,

1) 2023 12.31 දිනට ඉතිරි තොගය රුපියල් 20 000 කි.

2) ලී බඩු පිරිවැය මත 20% ක් හා ගොඩනැගිලි පිරිවැය මත 10%බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුවේ.

3) 2023 .03.31දිනට ගෙවිය යුතු විදුලි ගාස්තු රු .5000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අලාභ ප්‍රකාශනය (ලකුණු 06)

(ආ) 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 06)



CamScanner

2127

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# ஊவா மாகாண கல்வித் திணைக்களம்
# Uva Provincial Department of Education

## පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I | කාලය: පැය 01 යි. |
|---|---|---|

උපදෙස්:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40 කි.

01. රජයේ පිළිගත් ආයතනයකින් ඇඳුම් මැසීමේ පාඨමාලාවක් හැදෑරූ ලිහිණි තම දැනුම උපයෝගී කරගනිමින් ඇඳුම් මසා අලෙවි කරන ව්‍යාපාරයක් ආරම්භ කළාය. තමා විසින් ව්‍යාපාරයට යෙදූ මුදලට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීම සහ කිහිප දෙනෙකුට රැකියා අවස්ථා ලබා දීම මැයගේ ව්‍යාපාර අරමුණයි. ඇය සෑම මාසයකම රුපියල් 10 000 ක මුදලක් ලංකා බැංකුවේ ආරම්භ කරන ලද සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරයි.

මෙම සිද්ධියේ සඳහන් අවශ්‍යතාව සහ වුවමනාව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. මැහුම් පාඨමාලාව - අධ්‍යාපනය
2. ඇඳුම් - මසා නිමි ඇඳුම්
3. බැංකුව - ඉතිරි කිරීම
4. අධ්‍යාපනය - ස්වයං රැකියා

02. මෙම සිද්ධියේ සඳහන් ප්‍රධාන ව්‍යාපාර අරමුණ වන්නේ,

1. රැකියා අවස්ථා ලබා දීම.
2. සේවක සුබසාධනය.
3. ලාභ ඉපයීම.
4. ඇඳුම් සැපයීම.

03. මෙම සිද්ධියේ සඳහන් වන ලංකා බැංකුව,

1. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
2. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධානයකි.
4. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයකි.

04. මෙම සිද්ධියට අදාළ ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,

1. ඇඳුම් සැපයීම.
2. මැහුම් පාඨමාලාවක් හදාරා තිබීම.
3. රැකියා අවස්ථා ලබා දීම.
4. ලාභ ඉපයීම.

05. "ඉතිරි කිරීම් ගිණුම් සඳහා වන පොලී අනුපාතය ඉහළ දැමීමට රජය විසින් පියවර ගෙන ඇත." මෙම ප්‍රකාශය තුළ ඇතුළත් ව්‍යාපාර පරිසර සාධකය වන්නේ,

1. තාක්ෂණික පරිසරය
2. ගෝලීය පරිසරය
3. ආර්ථික පරිසරය
4. නෛතික පරිසරය

06. ඇල් මැති පාර්ශවයක් ලෙස කළමනාකරණයේ අරමුණක් වන්නේ,

1. ආයෝජනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීම
2. රැකියා සුරක්ෂිතභාවය
3. රැකියා වර්ධනය හා සංවර්ධනය
4. ගුණත්වයෙන් යුත් භාණ්ඩ ලබා ගැනීම.

07. හවුල් ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

1. වගකීම අසීමිත වීම.
2. නීතිමය පුද්ගල භාවයක් නොමැති වීම.
3. ලියා පදිංචිය අනිවාර්ය නොවීම.
4. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය.

08. චාන්දනී බේකරිය මගින් දන්සලක් සඳහා පාන් දෙසීයක් අලෙවි කිරීම සිදුකර ඇත. දන්සල සඳහා විදේශිකයින් ද සහභාගී වී සිටිනු දැක ගත හැකි විය. මෙහි දී සිදුව ඇති වෙළඳාම වන්නේ,

1. සිල්ලර වෙළෙඳාමේ
2. තොග වෙළඳාමේ
3. දේශීය වෙළඳාම
4. විදේශීය වෙළඳාම



CamScanner

09. තැන්පතු සඳහා පොලී හිමි නොවන ගිණුම වන්නේ,
1. සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම
2. ස්ථාවර ඉතිරි කිරීමේ ගිණුම්
3. අනේවාසික ඉතිරුම් ගිණුම්
4. ජංගම ඉතිරුම් ගිණුම

10. රක්ෂණයට සම්බන්ධයෙන් පළමු පක්ෂය වන්නේ,
1. රක්ෂකයා
2. රක්ෂා ගිවිසුමෙන් බලපෑම්වල අනෙකුත් පාර්ශව
3. රක්ෂිතයා
4. රක්ෂා හිමිකම

11. මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීමේ දී ඇපයක් ලෙස භාවිතා කළ හැකි රක්ෂණයක් වන්නේ,
1. ගිනි රක්ෂණ ඔප්පු
2. රථවාහන රක්ෂණ ඔප්පු
3. අපනයන ණය රක්ෂණ ඔප්පු
4. ජීවිත රක්ෂණ ඔප්පු

12. සන්නිවේදන මූලිකාංගයක් වන්නේ,
1. ප්‍රතිපෝෂණය
2. පිරිවැය
3. වේගවත් බව
4. පැහැදිලි බව

13. සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධකයකි.
1. මාර්ගය
2. පර්යන්තය
3. මාධ්‍යය
4. පිරිවැය

14. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක නියුතු අමල් තම ව්‍යාපාරයට කළමනාකරුවකු බඳවා ගෙන අදාළ මෙහෙයුම් කටයුතු සිදු කර ගෙන යාම් සඳහා ඔහුට අවශ්‍ය සම්පත් හා බලතල ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අයත් වන කළමනාකරණය කාර්ය වන්නේ,
1. සැලසුම් කිරීම
2. සංවිධානය කිරීම
3. මෙහෙයවීම
4. පාලනය

15. අලෙවි මිශ්‍රයේ නිෂ්පාදිතයට අයත් නොවන විචල්‍යය වන්නේ,
1. ගුණත්වය
2. අංගෝපාංග
3. ඇසුරුම
4. වට්ටම

16. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබන්නේ,
1. සමාගම් විසිනි
2. වාණිජ බැංකු විසිනි
3. ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි
4. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම් සභාව විසින්

17. වගකීම් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ආදායමක් වන්නේ,
1. විකුණුම්
2. පොලී ආදායම්
3. කුලී ආදායම්
4. ලද වට්ටම්

18. ණයගැතියන්ට රුපියල් 5000 ක මුදල් වට්ටම් ලබා දීම නිසා ඇතිවෙන ප්‍රතිඵලය වන්නේ,
1. මුදල් වත්කම වැඩි වේ. ණයගැති වත්කම අඩුවේ
2. ණයගැති වත්කම අඩුවේ වියදම් වැඩි වේ
3. වියදම් අඩුවේ ණය ගැති වත්කම වැඩි වේ
4. මුදල් වත්කම අඩුවේ ණයගැති වත්කම අඩුවේ

19. අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරන, ව්‍යාපාරය විසින් පාලනය කළ හැකි සම්පත් වන්නේ,
1. ආදායම්
2. වියදම්
3. වත්කම්
4. වගකීම්

20. 2024 ජනවාරි 31 දින සුළු මුදල් භාර කරු අත ඉතිරි මුදල රුපියල් 300 කි. 2024 පෙබරවාරි මාසයේ සුළු මුදල් අග්‍රිමය තවත් රුපියල් දාහකින් වැඩි කිරීමට ගත් තීරණයත් සමඟ 2024.2.1 දින සුළු මුදල් භාර කරුට ප්‍රතිපූරණය කරන ලද මුදල රුපියල් 4700 කි. ජනවාරි මාසයට අදාළ ව සුළු මුදල් භාරකරු විසින් දරා ඇති වියදම් වල අගය වන්නේ,
1. රුපියල් 4700
2. රුපියල් 3700
3. රුපියල් 5000
4. රුපියල් 4000

21. රුපියල් 25000 ක ගැනුම් ඉන්වොයිසියක් බැර සටහන නිවැරදිව තබා ගැනුම් ගිණුමේ රුපියල් 20000 ලෙස හරට සටහන් වීමේ වරද නිවැරදි කිරීමේ සටහන වන්නේ,

1. ගැනුම් ගිණුම (හර) 5000
   අවිනිශ්චිත ගිණුම 5000
2. ගැනුම් ගිණුම (හර) 5000
   ණයහිමි ගිණුම 5000
3. ගැනුම් ගිණුම (හර) 25000
   ණයහිමි ගිණුම 25000
4. ගැනුම් ගිණුම (හර) 5000
   මුදල් ගිණුම 5000

CS CamScanner

22. ක්ෂය වෙන් කිරීමේ ගිණුම
1. වගකීම් ගිණුමකි 2. හිමිකම් ගිණුමකි 3. වියදම් ගිණුමකි 4. වත්කම් ගිණුමකි

23. රුපියල් 185000 ක යන්ත්‍රයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා බ්‍රවුන්ස් සමාගමෙන් ණයට ගැනීම සටහන් කරන මූලික පොත වන්නේ,
1. ගැනුම් ජර්නලය 2. මුදල් පොත 3. විකුණුම් ජර්නලය 5. පොදු ජර්නලය

24. දම්රෝ ආයතනයේ වර්ෂ අවසානයේ අලෙවියට තබා තිබූ ගෘහ භාණ්ඩ සඳහා 20% වට්ටම් ලබා දෙන බව සඳහන් කර තිබුණි. මෙය,
1. මුදල් වට්ටමකි 2. වෙළඳ වට්ටමකි 3. ලද වට්ටමකි 4. දුන් වට්ටමකි

25. ව්‍යාපාරය විසින් සකස් කළ බැංකු ගිණුමේ හර ශේෂය රුපියල් පනස් දාහක් විය. නමුත් බැංකුව විසින් එවා තිබූ බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වඩා වැඩි විය. මීට හේතු විය හැක්කේ,
1. බැංකුව ලද සෘජු ප්‍රේෂණ ය
2. බැංකුව අය කළ බැංකු ගාස්තු ය
3. තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත් ය
4. බැංකුව විසින් ගෙවා තිබූ ස්ථාවර නියෝග ය

26. ව්‍යාපාරයක සියලුම ගිණුම් එකතු වන්නේ,
1. පොදු ජර්නලය
2. මුදල් ගිණුම
3. ශේෂ සැසඳුම් ලැයිස්තුව
4. පොදු ලෙජරය

27. වැඩි වීම හර අඩු වීම බැර ලෙස සඳහන් කෙරෙන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය වන්නේ,
1. වගකීම් 2. හිමිකම් 3. වත්කම් 4. ආදායම්

28. ශේෂ පිරික්සුමේ බැර ට පමණක් සටහන් වන ගිණුම් ඇතුළත් පිළිතුර වන්නේ,
1. විකුණුම්, වැටුප්, ණයගැති
2. ණයහිමි, විකුණුම්, පොලී ආදායම
3. ගැනුම්, රක්ෂණ, ණය හිමි
4. ගොඩනැගිලි, බොල් ණය, ණය හිමි

*** 29 හා 30 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ වේ.**

ගෘහ භාණ්ඩ නිපදවන ව්‍යාපාරයක දරන ලද වියදම් පහත වේ.

| | |
|---|---|
| ලී සඳහා | රු. 500 000 |
| වඩු කාර්මික වැටුප | රු. 200 000 |
| විදුලි ගාස්තු | රු. 20 000 |
| වැලි කඩදාසි | රු. 5 000 |

29. ගෘහ භාණ්ඩ සැකසීමට වැය කරන ලද සෘජු පිරිවැය වන්නේ,
1. 500 000 2. 505 000 3. 725 000 4. 700 000

30. මෙහි ඇතුළත් වක්‍ර වෙනත් වියදම් වන්නේ,
1. 5 000 2. 20 000 3. 200 000 4. 25 000

31. මිණිමුතු ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් ගණනක් 200 කි. එක් අයකුගේ වාර්ෂික සාමාජික මුදල රු.1000 වේ. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දි සාමාජිකයන් දහ දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොතිබුණි. සාමාජිකයන් පස් දෙනෙකුට 2024 වර්ෂය සඳහා අඩ මුදල් ගෙවා තිබුණි. මේ අනුව ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල් ආදායම වන්නේ,
1. 200 000 2. 190 000 3. 205 000 4. 195 000

32. ගිණුම්කරණ සමීකරණය මගින් නිරූපණය කෙරෙන ආකාරයට වත්කම් වගකීම් හා හිමිකම් අතර ඇති සම්බන්ධතාව දක්වන මූල්‍ය ප්‍රකාශනය වන්නේ,
1. ලාභ ලාභ ප්‍රකාශනය
2. ආදායම් ප්‍රකාශනය
3. ශේෂ පිරික්සුම
4. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය



CamScanner

33. සුදර්ශන විසින් තම ව්‍යාපාරයට 2023.01.01 දිනට යොදවා තිබූ ප්‍රාග්ධනය රු.800 000 විය. 2023.12.31 අවසන් වර්ෂයේ එම ව්‍යාපාරය ඉපැයූ ශුද්ධ ලාභය රු.200 000 වන අතර, සුදර්ශන තම පෞද්ගලික ප්‍රයෝජනයට රු. 20 000 ක මුදලක් ව්‍යාපාරයෙන් ලබා ගෙන තිබුණි.

2023.12.31 දිනට සුදර්ශනගේ හිමිකම වන්නේ,

1. 200 000  2. 800 000  3. 180 000  4. 980 000

34. අශ්මාගේ ව්‍යාපාරයේ යන්ත්‍ර පිරිවැය 500 000 කි. එහි සුන්බුන් අගය 50 000 ක් වූ අතර ඵලදායී ජීවිත කාලය වසර දහයක් විය. වත්කම සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. මෙම ව්‍යාපාරයේ යන්ත්‍රවල වාර්ෂික ප්‍රමාණය කොපමණද?

1. 50 000  2. 500 000  3. 45 000  4. 55 000

35. සාමාන්‍ය කොටස් මිල දී ගැනීම නිසා හිමි වන ප්‍රතිලාභයක් නොවන්නේ මින් කුමක් ද?

1. ලාභාංශ ලැබීම  2. ඡන්ද බලය හිමි වීම.
3. ප්‍රාග්ධන ලාභ ලැබීම  4. ස්ථාවර පොලී ආදායමක් ලැබීම

*** 36 සිට 40 තෙක් පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කර ගන්න.**

මලිතිගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට පහත ශේෂ ඉදිරිපත් කරයි.

| | | | |
|---|---|---|---|
| ගැනුම් | 500000 | වැටුප් හා වේතන | 50000 |
| විකුණුම් | 800000 | වෙනත් ආදායම් | 100000 |
| 2023.01.01 තොගය | 20000 | විදුලි වියදම් | 10000 |
| 2023.12.31 තොගය | 40000 | ගොඩනැගිලි | 200000 |
| ගෙන ඒමේ කුලී | 10000 | ගොඩනැගිලි ක්ෂය | 20000 |
| පැටවුම් හා බෑමේ කුලී | 15000 | ප්‍රාග්ධනය | 100000 |
| මුදල් | 50000 | ණය හිමි | 25000 |
| ණයගැති | 20000 | බැංකු ණය | 100000 |

36. මෙම ව්‍යාපාරයේ 2023.12.31 අවසන් වසරේ විකුණුම් පිරිවැය වන්නේ,

1. 295 000  2. 505 000  3. 545 000  4. 530 000

37. මෙම ව්‍යාපාරයේ 2023.12.31 අවසන් වසරේ දළ ලාභය වන්නේ,

1. 505 000  2. 395 000  3. 295 000  4. 315 000

38. මෙම ව්‍යාපාරයේ පරිපාලන වියදම් වල වටිනාකම වන්නේ,

1. 50 000  2. 70 000  3. 105 000  4. 80 000

39. මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනට ජංගම වත්කම්වල වටිනාකම වන්නේ,

1. 110 000  2. 90 000  3. 70000  4. 60 000

40. 2023.12.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු වත්කම් වටිනාකම වන්නේ,

1. 180 000  2. 290 000  3. 110 000  4. 310 000

CamScanner